බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ
හෙද නිලධාරී තනතුර සඳහා වන සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය

1. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : බන්ධනාගාර
යොමු අංකය : ඩී8/21/බ.පරි/හෙද

දිනය : 2014.10.16
2015.06.24
2018.09.27

1.2 අමාත්‍යාංශය : අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා
යොමු අංකය : MOJ/E22/බඳවා ගැනීමේ පරිපාටි/හෙද — දිනය : 2019.03.25
යොමු අංකය : MOJ/E22/බඳවා ගැනීමේ පරිපාටි/හෙද — දිනය : 2025.03.

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : DMS/B2/48/01/Vol II — දිනය : 2013.09.24
යොමු අංකය : DMS/1146/Vol-II — දිනය : 2018.05.30
යොමු අංකය : DMS/1146/IX — දිනය : 2023.10.31

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය : EST-2-RECRU/05/4818 — දිනය : 2018.12.06
යොමු අංකය : EST-2-RECRU/05/4818 — දිනය : 2025.01.20

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය : NSCC/3/40/94/SR — දිනය : 2018.11.15

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
යොමු අංකය : PSC/EST/07-01-18/01/2015 — දිනය : 2019.06.27

පළමු සංශෝධිත දිනය : 2021.05.18
දෙවන සංශෝධිත දිනය: 2022.12.01
තෙවන සංශෝධිත දිනය: 2026.02.09

2. පත්කිරීමේ බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

3. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : හෙද සේවය

3.2 ශ්‍රේණි : III, II, I හා අධි ශ්‍රේණි

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය: රෝග නිවාරණය, සෞඛ්‍ය අභිවර්ධනය, වේදනාවන්ගෙන් මුදවා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වූ කාර්ය කිරීම පිණිස මූලික මිනිස් අවශ්‍යතා හඳුනා ගනිමින්, විද්‍යාත්මක මූලධර්ම පදනම්ව, රෝගී සත්කාර සේවා, ප්‍රජා මානසික/හෙද සේවා ක්ෂේත්‍රයෙහි මනා ක්‍රියාකාරිත්වය සඳහා ඉවහල් වන්නාවූ සුවිශේෂිතව පවරා දෙනු ලබන කාර්යන්ද උපකාරක හෝ පහසුකාරක කාර්යන්ගෙන්ද සමන්විත වන්නාවූ ක්‍රියාවලියකි.

3.4 කාර්යයන් පැවරීම:
ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝෂ්‍යතාවය හා කුසලතාවය පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

4. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.)

5. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MT – 7 – 2025

5.2 මාසික වැටුප් පරිමාණය : රු.54,920-10x800-11x1190-10x1320-10x1350- රු.102,710/-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 54,920/- |
| II | පියවර 12 | 64,110/- |
| I | පියවර 23 | 77,330/- |
| අධි | පියවර 34 | 91,910/- |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව පුහුණු කාල සීමාව තුළදී පළමු වර්ෂයේදී මාසික දීමනාව ලෙස රු.41,317/- ක්ද, දෙවන වර්ෂයේදී මාසික දීමනාව ලෙස රු.41,689/- ක්ද, තෙවන වර්ෂයේදී මාසික දීමනාව ලෙස රු.42,061/- ක්ද ලබා දෙනු ඇත.

6. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව සහ එම තනතුරුවලට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| හෙද නිලධාරී | III,II,I හා අධි ශ්‍රේණි | 70 | රෝග නිවාරණය, සෞඛ්‍ය අභිවර්ධනය, වේදනාවන්ගෙන් මුදවා ගැනීම හා පුනරුත්ථාපනය සඳහා වූ කාර්ය කිරීම පිණිස මූලික මිනිස් අවශ්‍යතා හඳුනා ගනිමින්, විද්‍යාත්මක මූලධර්ම පදනම්ව රෝගී සත්කාර (රෝහල් හා සායන) සේවා, ප්‍රජා /මානසික හෙද සේවා, හෙද අධ්‍යාපන සේවා හා විශේෂිත/පර්යේෂණ හෙද සේවා යන ක්ෂේත්‍රයන්හි මනා ක්‍රියාකාරිත්වය සඳහා ඉවහල් වන්නා වූ සුවිශේෂිතව පවරා දෙනු ලබන කාර්යයන්ද උපකාරක හෝ පහසුකාරක කාර්යයන්ගෙන්ද සමන්විත වන්නා වූ කාර්යාවලියකි. |
| I ශ්‍රේණියේ/අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) | I/අධි ශ්‍රේණිය | 08 | |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : III, II, I හා අධි ශ්‍රේණි - 70
I/අධි ශ්‍රේණිය - 08

සටහන : ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I හා අධි ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සලකනු ලැබේ.

:

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | - |

සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන් නොමැති නම්, එම ප්‍රතිශතය ද බාහිරින් බඳවා ගනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III

7.2.2. සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : I. අ.පො.ස (උ.පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවට අයත් ජීව විද්‍යාව/ගණිතය/කෘෂි විද්‍යාව/විෂය ධාරාවෙන් සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වීම, පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයන් තුනකින් එකවර සමත් වීම.

සහ

II. සිංහල/දෙමළ භාෂාව,ගණිතය,විද්‍යාව, හා ඉංග්‍රීසි යන විෂයන් හතර (04) කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හය (06) කින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

හෝ

III. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් විද්‍යාවේදී (හෙද) උපාධිය සම්පූර්ණ කර තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.2.2.3 පළපුරුද්ද :අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් : I. සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සහ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතුය.

II. පිරිමි - අවම උස අඩි 05 අඟල් 04 (162.5 cm)
කාන්තා - අවම උස අඩි 05 අඟල් 02 (157 cm)

III. පිරිමි අයදුම්කරුවන් සඳහා පපුව හුස්ම නාල්ලා අඟල් 32 ක් (81.25 cm) විය යුතුය. කාන්තාවන් සඳහා අදාළ නොවේ.

7.2.2.5 වෙනත්

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

II. අවිවාහක විය යුතුයි. උපාධිධාරීන්ට මෙය අදාළ නොවේ.

III. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.

IV. ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකිය. (හෙද නිලධාරිනියන් බඳවා ගැනීම සේවා අවශ්‍යතාවය මත තීරණය කෙරේ.)

V. සේවා අවශ්‍යතාව මත කාන්තා නිලධාරිනියන් බඳවා ගැනීමේ ප්‍රමාණය තීරණය කෙරේ.

VI. සුදුසුකම් ලබන දිනට ඉහත 7.2.2 වැනි ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන

දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික වල පිටපත් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.

7.2.3 වයස

7.2.3.1.අවම සීමාව : වයස අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : වයස අවුරුදු 28 ට නොවැඩි (විද්‍යාවේදී උපාධිය මත බඳවා ගැනීමේදී උපරිම වයස් සීමාව : අවු : 35 ට නොවැඩි)

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත බඳවා ගැනීම සඳහා තෝරා ගැනීමට සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගේ නාම ලේඛනයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට බඳවා නොගන්නා ඊළඟට සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් කැමැත්ත විමසා හෙද පුහුණුවට තෝරා ගනු ලබන අතර, සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පාලනය වන හෙද විද්‍යාලක සියු හෙද/හෙදියන් වශයෙන් තුන් අවුරුදු හෙද පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසු බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හෙද නිලධාරී III පන්තියට බඳවා ගනු ලැබේ.

විද්‍යාවේදී (හෙද) උපාධිය මත සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ නාම ලේඛනයේ ඊළඟට සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගේ කැමැත්ත විමසා පුහුණුවට තෝරාගෙන පාඨමාලාවට ඇතුලත්ව එම පාඨමාලාව සම්පූර්ණ කරන අයදුම්කරුවන් පුහුණුව අවසානයේ පවත්වනු ලබන පරීක්ෂණය සමත් වීමෙන් අනතුරුව බන්ධනාගාර හෙද සේවයේ III ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය :අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධාරියා : සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් තෝරා ගන්නා බැවින් අදාළ නොවේ.

7.2.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් අයදුම්පත් කැඳවා එම දෙපාර්තමේන්තුවේ පුහුණුවට තෝරා ගැනීමෙන් පසු ඊළඟට සුදුසුකම් ලබන අයදුම්කරුවන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා හෙද පුහුණුවට බඳවා ගැනේ.

7.3 සීමිත බඳවා ගැනීම :

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2. සුදුසුකම්

7.3.2.1.අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස (උ.පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවට අයත් ජීව විද්‍යාව/ගණිතය/කෘෂි විද්‍යාව/විෂය ධාරාවෙන් සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම, පැරණි විෂය නිර්දේශය යටතේ විෂයන් තුනකින් එකවර සමත් වීම.

සහ
සිංහල/දෙමළ භාෂාව,ගණිතය, විද්‍යාව, හා ඉංග්‍රීසි යන විෂයන් හතර (04) කට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හය (6) කින් අ.පො.ස (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.

7.3.2.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.3 පලපුරුද්ද : අදාළ නොවේ.

7.3.2.4. කායික සුදුසුකම් :I. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශකය සේවය කිරීම සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.
II. අවම උස අඩි 05 අඟල් 04 (162.5 cm) (පිරිමි)
III.අවම උස අඩි 05 අඟල් 02 (157 cm) (කාන්තා)
IV.පිරිමි අයදුම්කරුවන් සඳහා පපුව හුස්ම නාල්ලා අඟල් 32 ක් (81.25 cm) විය යුතුය. කාන්තාවන් සඳහා අදාළ නොවේ.

7.3.2.5. වෙනත් : I. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු විය යුතුය.
II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.
III. ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකිය.
IV. සේවා අවශ්‍යතාවයන් මත කාන්තා නිලධාරිනියන් බඳවා ගැනීමේ ප්‍රතිශතය තීරණය කරනු ලැබේ.
V. සුදුසුකම් ලබන දිනට ඉහත 7.2.2 වැනි ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික වල පිටපත් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

7.3.3.වයස : අදාළ නොවේ.

7.3.4. බඳවා ගැනීමේ ක්‍රමය:

7.3.4.1.ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.3.4.2. වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා

7.3.4.3.1.සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධාරියා : සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් සම්මුඛ පරීක්ෂණ පවත්වා තෝරාගනු ලැබේ.

7.3.4.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : සියලු බන්ධනාගාර ආයතන දැනුවත් කර අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4. කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

8.කාර්යක්ෂමතා කඩඉම

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ඇමුණුම 01 බලන්න. |
| II වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස්වී වසර තුන (03) ක් ගතවීමට පෙර | ඇමුණුම 02 බලන්න. |
| III වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර | ඇමුණුම 03 බලන්න. |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : අවම වශයෙන් වසරකට එක්වරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද: සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් (සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෙද නිලධාරීන් පෙනී සිටින විභාගයට පෙනී සිට සමත් විය යුතුය.)

09. භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03 ක් ඉකුත් වීමට පෙර ලබා ගත යුතුය. |
| 02.අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

10.ශ්‍රේණි උසස් කිරීම

10.1. III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම් ස්ථිර කර තිබීම (තනතුරෙහි ස්ථිර කිරීමේ ලිපියක් නිකුත් කර තිබිය යුතුය)

II. සේවා ගණයේ III ශ්‍රේණියේ වසර පහක (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ පූර්වාසන්න වසර පහ (05) ක් තුළ සතුටුදායක හෝ එයට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය නියමිත දිනට සමත්ව තිබීම

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

VI. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

10.1.1.2.උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය පරිදි ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.2.II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1. සාමාන්‍ය කාර්යසාධනය අනුව

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම්:

I. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හෙද සේවා ගණයේ II ශ්‍රේණියේ වසර හත (07) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ කාලයට නියමිත වැටුප් වර්ධක හත (07) ක් උපයාගෙන තිබීම.

II. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ පූර්වාසන්න වසර හත (07) ක් තුළ සතුටුදායක හෝ එයට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

III. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය නියමිත දිනට සමත්ව තිබීම.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය:
සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය පරිදි ඉල්ලීමක් කරනු ලැබූ විට පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.3 I වන ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරීම.

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.
II. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.
IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය : සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය පරිදි ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සංලක්ෂය :
සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීමේ දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11.තනතුරුවලට පත් කිරීම :
11.1

| තනතුර | | සුදුසුකම් | තෝරා ගනු ලබන ආකාරය |
|---|---|---|---|
| I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා)<br>අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) | I.<br><br><br>II. | II ශ්‍රේණියේ, I වැනි ශ්‍රේණියේ හෝ අධි ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.<br>ජාතික හෙද අධ්‍යාපන ආයතනය/පශ්චාත් ප්‍රාථමික හෙද විද්‍යාල විසින් පවත්වනු | (01) පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 35% පිරවීම සඳහා II ශ්‍රේණියේ, I ශ්‍රේණියේ හා අධි ශ්‍රේණියේ පහත දැක්වෙන සුදුසුකම් සහිත නිලධාරීන් අතරින් |

| | | |
|---|---|---|
| | ලබන වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය මානසික හෙදකම/අඩංගු අවුරුදු 1 ½ ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඉන් සමත් වූ නිලධාරියකු වීම.<br>III. පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>IV. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.<br>V. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛයන් හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.<br><br>සටහන :<br><br>01. මෙම තනතුරට පත්කරනු ලබන I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරු නාමය හෙද නිලධාරී සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ද, අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරු නාමය හෙද නිලධාරී සේවා ගණයේ අධි ශ්‍රේණියේ නිලධාරීන් සඳහාද භාවිතා කළ යුතුය.<br>02. I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරු දරන නිලධාරීන් හෙද නිලධාරී සේවා ගණයේ අධි ශ්‍රේණියට උසස් කිරීම බඳවා ගැනීමේ පටිපාටියේ 10.3 වගන්තිය අනුව සිදුකරනු ලැබේ.<br>03. I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරක සේවයේ යෙදී සිටින අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරට පත්වීම හේතුවෙන් හෙද නිල ඇඳුම් හෝ දැනට දරන තනතුරට අදාළ වගකීම් වල වෙනසක් සිදු නොවේ. | ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා ලිඛිත තරඟ විභාගයක් පවත්වනු ලැබේ. විභාගයේ විෂය නිර්දේශය ඇමුණුම 04 මගින් දැක්වේ.<br>i. පූර්වාසන්නතම වසර පහ (05) තුල නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>ii. අනුමත කාර්යසාධන පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුල සතුටුදායක මට්ටමට වඩා ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.<br>iii. වයස අවුරුදු 48 නොඉක්මවා තිබීම.<br>(02) ලිඛිත තරඟ විභාගයෙන් ඉහලම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරාගනු ලබන අතර, ඉන් සමත් වූ නිලධාරීන් අතුරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය මත තනතුරුවලට පත් කිරීම සිදු කෙරේ.<br>(03) ඉතිරි 65% ක පුරප්පාඩු ප්‍රමාණය පිරවීම සඳහා II ශ්‍රේණියේ, I ශ්‍රේණියේ හා අධි ශ්‍රේණියේ සිටින පහත දැක්වෙන සුදුසුකම් සහිත නිලධාරීන්ගෙන් ජ්‍යෙෂ්ඨතාවය, කුසලතාවය, යෝග්‍යතාවය, වැඩ හා හැසිරීම අනුව සෞඛ්‍ය ලේකම් විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ඉන් සමත්වන නිලධාරීන් අතරින් ඉහත ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබේ. ඇමුණුම 05 මගින් සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය දැක්වේ.<br>i. පූර්වාසන්නතම වසර පහ (05) තුල නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රිය හා සතුටුදායක |

| | | |
|---|---|---|
| | | සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>ii. අනුමත කාර්යසාධන පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුල සතුටුදායක මට්ටමට වඩා ඉහල කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.<br>iii. වයස අවුරුදු 48 නොඉක්මවා තිබීම. |

සටහන

1) I ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා) තනතුරෙහි ඇති වන පුරප්පාඩු සංඛ්‍යාවට අනුව වසරකට වරක් ලිඛිත තරඟ විභාගය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.
2) ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගන්නා නිලධාරීන් පුහුණුව ආරම්භ කිරීමට පෙර බන්ධනාගාර කොමසාරිස් ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.
3) ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට තෝරා ගන්නා ලද නිලධාරියකු පුහුණුවෙන් අනතුරුව ඉහත දැක්වෙන තනතුරකට පත් කිරීමෙන් අනතුරුව සති දෙකක් තුල අදාළ තනතුරෙහි සේවයට වාර්තා කල යුතුය. එසේ තනතුර භාර නොගන්නා නිලධාරීන් හා පුහුණුව සාර්ථකව නිම නොකරන නිලධාරීන් ගිවිසුම් ගත මුදල ගෙවිය යුතු අතර ඔවුන් පෙර දැරූ තනතුරට යවනු ලැබේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

I. සිසු හෙද පුහුණුව දිවයින පුරා ඇති හෙද විද්‍යාල වල පවත්වනු ලැබේ.
II. පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ නියමිත විභාගයෙන් අසමත් වන හෝ අධ්‍යයන කටයුතු හා හැසිරීම අසතුටුදායක වන හෝ හෙද විද්‍යාල වල බල පැවැත්වෙන නීති රීති මාලාව ප්‍රකාරව විභාග හා නිවාඩු කොන්දේසි පිලිපැදීමට අපොහොසත් වන්නා වූ අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක අවසන් කළ හැක.
III. පුහුණු කාලය තුළ අවිවාහකව සිටිය යුතුය.
IV. පුහුණුව ආරම්භ කිරීමට ප්‍රථම රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.
V. සාර්ථකව සිසු හෙද පුහුණුව නිම කරන සිසුහු හෙද/හෙදියෝ සේවාවේ III වන ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩු සඳහා පත් කිරීමට සුදුසුකම් ලබති.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ: අදාළ නොවේ.

14. ගිවිසුම් :

I. අභ්‍යාසලාභීන් පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් පසුව පවත්නා පුරප්පාඩු අනුව හෙද සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරකට පත්වීමක් ලද හොත් අවුරුදු 10 ක කාලයක් රජයට සේවය කරන බවට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.
අදාල ගිවිසුම සිසු හෙද පුහුණුවට ඇතුළත්ව පළමු මාසය තුළ අත්සන් කළ යුතු අතර, පුහුණුව අතහැර යනු ලබන අභ්‍යාසලාභීන් ගිවිසුම් ගත මුදල (මෙම මුදල ලේකම් විසින් වරින් වර තීරණය කරනු ලැබේ.) හා එතෙක් ලබා ඇති දීමනා ආපසු ගෙවීම අනිවාර්යය වේ.

15. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :

1. මෙම පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති MT 7 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හෙද

නිලධරයන් ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව මෙම බඳවා ගැනීමේ පටිපාටියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

2. සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වුවද, අන්තර්ග්‍රහණය හේතුවෙන් නිලධරයාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ නිලධරයා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද නොකළ යුතුය.

3.

I. හෙද සේවයේ II "ආ" ශ්‍රේණියේ නිලධාරීන් III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

II. හෙද සේවයේ II "අ" ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

III. හෙද සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට අන්තතර්ග්‍රහණය කරනු ලැබේ.

IV. හෙද සේවයේ I ශ්‍රේණියේ අවුරුදු දහය (10) කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද, එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන ඇති හා අධි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් අධි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

16. බන්ධනාගාර හෙද නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම හා පුහුණු කිරීම සහ බන්ධනාගාර හෙද නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේ පරීක්ෂණය පැවැත්වීම සහ ඔවුන් සඳහා පශ්චාත් උපාධි පාඨමාලාව පැවැත්වීම සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කෙරෙන බැවින් ඒ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ක්‍රියාත්මක වන ක්‍රමයන්හි යම් සංශෝධනයක් වන්නේ නම් ඒ හැම සංශෝධනයක්ම මෙම බඳවා ගැනීමේ පරිපාටිය සඳහා අදාල වේ.

17. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

18. මෙම බඳවා ගැනීම් පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

19. අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ.

සකස් කළේ : අත්සන :..............................
(විෂය භාර කණිෂ්ය මාණ්ඩලික නිලධරයා)

නම: ඩබ්ලිව්.එම්. තිස්ස බණ්ඩාර
තනතුර: පරිපාලන නිලධාරී I (මැ/ආ)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය:2026.04.

පරීක්ෂා කළේ : අත්සන :....................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම: ඩොනල්ඩ් මුරගේ
තනතුර: බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය:2026.04.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :.............................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම:.............................................
තනතුර:.............................................
නිල මුද්‍රාව: ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

දිනය : 2026.04.15 . 04

20. අමාත්‍යාංශ නිර්දේශය

යොමු අංකය :..............................................................

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ...................දින අනුමත කරන ලද .........................අමාත්‍යාංශයෙහි/දෙපාර්තමේන්තුවෙහි ..............සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :..........................................................

නම :..............................................................

(අදාළ අමාත්‍යාංශ ලේකම්)

දිනය : 2026.04.

නිල මුද්‍රාව :.................................................

---

21.රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

යොමු අංකය :....................................

.......................................අමාත්‍යාංශයෙහි/දෙපාර්තමේන්තුවෙහි ...................සේවා ගණය සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් .................දින අනුමත කරන ලදී.

අත්සන :..........................................................

නම :..........................................................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය :2026.04.

නිල මුද්‍රාව :.....................................................

ඇමුණුම 01

විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හෙද නිලධාරී තනතුර සඳහා පළමුවන කාර්යක්ෂමතා විභාගය

02. විභාගය පිළිබඳ විස්තර : :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| I පත්‍රය | පැය 03 | 100% | 40% |
| II පත්‍රය | පැය 03 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග: වසරකට එක්වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති I වන කාණ්ඩය | • ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද VII, VIII, XII, XIII, XVII, XVIII, XXII, XXIII, XXV |
| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.157 දක්වා කරුණු පිළිබඳව |

I. තනතුරට බඳවා ගැනීමට පෙර සිසු/හෙදියන් වශයෙන් පුහුණුවට ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු වේ.

II. තනතුරේ III වන ශ්‍රේණියේ නිලධාරීහු මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති.

III. සියලු විෂයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කීපයකදී හෝ පෙනී සිටීමට අවසර ඇත.

සකස් කළේ :

අත්සන :........................................

නම :........................................ තිස්ස බණ්ඩාර

තනතුර :........................................ නිලධාරී I

බන්ධනාගාර මූලස්ථානය

කොළඹ 09.

දිනය : 2026.04.

පරීක්ෂා කළේ :

අත්සන :........................................

නම :........................................

තනතුර :........................................

බන්ධනාගාර මූලස්ථා...

කොළඹ 09.

දිනය : 2026.04.

අත්සන

:..............................................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :..............................................................

තනතුර :..............................................................

දිනය :2026.04.

නිල මුද්‍රාව :..............................................................

බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.අ.)

බන්ධනාගාර මූලස්ථානය

කොළඹ 09.

ඇමුණුම 02

විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හෙද නිලධාරී තනතුර සඳහා දෙවන කාර්යක්ෂමතා විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| හෙදකම පිළිබඳ න්‍යායාත්මක දැනුම | පැය 03 | 100% | 40% |
| වාට්ටු කළමනාකරණය | පැය 03 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට එක්වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| හෙදකම පිළිබඳ න්‍යායාත්මක දැනුම | • හෙදකම පිළිබඳ න්‍යායාත්මක දැනුම<br>• ශල්‍ය හෙදකම<br>• වෛද්‍ය හෙදකම<br>• ළමා හෙදකම |
| වාට්ටු කළමනාකරණය | • වාට්ටු කළමනාකරණය<br>• රෝගී සාත්තු කළමනාකරණය<br>• පංචවිධ සංකල්ප<br>• ක්‍රියාමාර්ග සැලැස්ම - මාසිකව/වාර්ෂිකව |

1) තනතුරට බඳවා ගැනීමට පෙර සිසු/හෙදියන් වශයෙන් පුහුණුවට ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු වේ.
2) II වන ශ්‍රේණියේ නිලධාරීහු මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති.
3) සියලු විෂයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කීපයකදී හෝ පෙනී සිටීමට අවසර ඇත.

සකස් කළේ :
අත්සන :..............................................
නම :ඩබ්ලිව්.එම්. තිස්ස බණ්ඩාර
තනතුර :...... නිලධාරී I (වැ/ආ)
දිනය :2026.04. ...ගාර මූලස්ථානය
කොළඹ 09.

පරීක්ෂා කළේ :
අත්සන :..............................................
නම :..............................................
තනතුර :..............................................
දිනය :2026.04.
කොළඹ 09.

අත්සන :..............................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :..............................................
තනතුර :..............................................
දිනය :2026.04.
නිල මුද්‍රාව :..............................................

බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (...)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

ඇමුණුම 03

විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ නම : බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ හෙද නිලධාරී තනතුර සඳහා පෙවන කාර්යක්ෂමතා විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| පොදු කළමනාකරණය | පැය 03 | 100% | 40% |
| පොදු හෙදකම | පැය 03 | 100% | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධාරියා : සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට එක්වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| පොදු කළමනාකරණය | • රෝගී සාත්තු සැලැස්ම<br>• කාර්ය මණ්ඩල සුපරීක්ෂණය හා අධීක්ෂණය<br>• වගකීමක් සහිත කාර්ය පැවරීම - Delegation<br>• නායකත්වය - Leadership<br>• මානව සම්පත් කළමනාකරණය |
| පොදු හෙදකම | • ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය (කරුණු 17 ට අදාළව)<br>• රෝගී නිවාරණ හා සෞඛ්‍ය ප්‍රවර්ධනය<br>• අධ්‍යාපන විද්‍යා මූලධර්ම<br>• හෙද පර්යේෂණ මූලධර්ම<br>• වාට්ටු පරිපාලනය<br>• සන්නිවේදනය<br>• කණ්ඩායම් සංකල්ප<br>• කාර්ය මණ්ඩල සංවර්ධනය |

1) තනතුරට බඳවා ගැනීමට පෙර සිසු/හෙදියන් වශයෙන් පුහුණුවට ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු වේ.

2) I වන ශ්‍රේණියේ නිලධාරීහු මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබති.

3) සියලු විෂයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාර කීපයකදී හෝ පෙනී සිටීමට අවසර ඇත.

සකස් කළේ :

අත්සන :................................

නම : ...එම්. තිස්ස බණ්ඩාර

තනතුර :............ නිලධාරී I (වෛ/ආ)

දිනය : 2026.04. ...ගාර මූලස්ථානය

කොළඹ 09.

පරීක්ෂා කළේ :

අත්සන :..........................................................

නම :..........................................................

තනතුර :..........................................................

දිනය : 2026.04.

කොළඹ 09.

අත්සන :..........................................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :..........................................................

තනතුර :..........................................................

දිනය :2026.04...

නිල මුද්‍රාව :..........................................................

ආර්. ප්‍රසාද් ... කුමාර

බන්ධනාගාර කොමසාරිස් ... (ශ.ආ.)

බන්ධනාගාර මූලස්ථානය

කොළඹ 09.

ඇමුණුම 04

විභාග පිළිබඳ ආකෘතිය

විභාගයේ නම : මාණ්ඩලික හෙද I ශ්‍රේණියේ නිලධාරීන් (රෝහල් සේවා) වශයෙන් පත් කිරීම සඳහා පුහුණුවට තෝරා ගැනීම.

විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සරල වාක්‍ය රචනය | පැය 01 | 100% | 40% |
| හෙදකම පිළිබඳ කාලීන ප්‍රවණතා | පැය 02 | 100% | 40% |

02. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්

03. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : පවත්නා පුරප්පාඩු අනුව අවශ්‍යතාවය සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ඇත.

04. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සරල වාක්‍ය රචනය | මෙම ප්‍රශ්න පත්‍රය සඳහා වාක්‍ය රචනයක් ලිවීම ඇතුලත් වේ. |
| හෙදකම පිළිබඳ කාලීන ප්‍රවණතා | කාලීන වශයෙන් හෙද නිළධාරියෙකු විසින් පොදු හෙදකම පිළිබඳව ලබා තියෙන දැනුම පරීක්ෂා කර බැලීම. |

සකස් කළේ :
අත්සන :............
නම : ඩබ්ලිව්.එම්. තිස්ස බණ්ඩාර
තනතුර : පරිපාලන නිලධාරී I (මැ/ආ)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය :2026.04.

පරීක්ෂා කළේ :
අත්සන :............
නම : ඩොනල්ඩ් මුරගේ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
දිනය :2026.04.

අත්සන :............
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :............
තනතුර :............
දිනය :2026.04.
නිල මුද්‍රාව : ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රැ.ආ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

ඇමුණුම 05

හෙද සේවාවේ I වැනි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා,) ලෙස පත් කිරීම සඳහා වන පුහුණුවට ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත තෝරා ගැනීම සඳහා වන ලකුණු දීමේ පටිපාටිය

| අනු අංකය | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | ජ්‍යෙෂ්ඨතාවය<br>(හෙද සේවයේ II,I හා අධි පංතියේ සෑම වසරක් සඳහාම ලකුණු 08 බැගින්) | 80 | අදාල නොවේ |
| 02. | කුසලතාවය<br>• විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගන්නා ලද උපාධියක් සඳහා - ලකුණු 5<br>• සෞඛ්‍ය ලේකම් විසින් පිලිගනු ලබන ආයතනයකින් විෂය ක්ෂේත්‍රයට අදාලව ලබා ගත් ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 3<br>• විශේෂ ක්‍රියාකාරකම් - ලකුණු 12 (සෑම විශේෂ ක්‍රියාකාරකමක් සඳහාම ලකුණු 02 බැගින් ලබා දෙන අතර, අදාල ක්ෂේත්‍රයට අදාලව ලකුණු ලබා දිය යුතු විශේෂ ක්‍රියාකාරකම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ඇත.) | 20 | |
| | එකතුව | 100 | |

සකස් කළේ :
අත්සන :..........................................
නම ඩබ්ලිව්.එම්. තිස්ස බණ්ඩාර
තනතුර : පරිපාලන නිලධාරී I (වැ/ආ)
දිනය :2026.04.
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

පරීක්ෂා කළේ :
අත්සන :..........................................
නම : ඩොනල්ඩ් මුරගේ
තනතුර : බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්)
දිනය :2026.04.
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

අත්සන :..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම :..........................................
තනතුර :..........................................
දිනය :2026.04.
නිල මුද්‍රාව :..........................................

ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා.ආ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.